LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය

# නව නීති සහ විධායක තීරණ පිළිබඳ යාවත්කාලීන කිරීම

# - 2026 මැයි -

10th May 2026

LAW TRACKER

# නව නීති සහ විධායක තීරණ - 2026 මැයි

*සාරාංශය | 2026 මැයි 10*

## ශ්‍රී ලංකාවේ නීති සම්පාදන ක්‍රියාවලිය




## 2026 මැයි මාසයේ යාවත්කාලීන කිරීම්

### I. ගැසට් පත්‍රයේ පළකරන ලද පනත් කෙටුම්පත්

- **2026 අංක 36 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත** (2026 මැයි 15 දින ගැසට්පත්‍රයේ පළ කරන ලදී) - 2009 අංක 35 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත සම්පූර්ණයෙන්ම අහෝසි කර, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී තනතුර සහ අදාළ කමිටුව ද අහෝසි කරයි. මෙමගින් සංක්‍රාන්ති වැඩපිළිවෙළ සඳහා, එනම් කාර්ය මණ්ඩල ඔවුන්ට අදාළ සේවාවන්ට නැවත අනුයුක්ත කිරීම, වත්කම් සහ වගකීම් ආරක්ෂක අමාත්‍යාංශයට පවරා දීම, අවසන් කර නොමැති නීති කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සහ අහෝසි කරන ලද පනත යටතේ සාදන ලද සියලුම නියෝග අවලංගු කිරීම සඳහා විධිවිධාන සලසයි.

### II. පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පනත් කෙටුම්පත්

- 2026 අංක 38 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත - 2026 ජූලි 1 වන දින සිට මෙමගින් ඉලෙක්ට්‍රොනික වේදිකා හරහා නිර්වාසික පුද්ගලයන් විසින් සපයනු ලබන ඩිජිටල් සේවා එකතු කළ අගය මත බදු රාමුව තුළට ගෙන එයි; එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි කිරීමේ සීමාව අඩු කරයි; මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු අනුපාතය 18% සිට 20.5% දක්වා ඉහළ නංවයි; සහ සියලුම ලියාපදිංචි පුද්ගලයන් විසින් ආරක්ෂිත විකුණුම් ස්ථාන යන්ත්‍ර භාවිතය අනිවාර්ය කරයි. බදු ගෙවීම පැහැර හැරීම් සහ මුදල් ආපසු ගෙවීමේ වංචනික හිමිකම් පෑම් සඳහා දඬුවම් වැඩි කරයි; අපරාධ නඩු විධිවිධාන පුළුල් කරයි; ලියාපදිංචි බදු ගෙවන්නන් පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධියේ හෙළි කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට බලය පවරයි; සහ යෙදවුම් බදු බැර, වාර්තා තබා ගැනීම සහ මුදල් ආපසු ගෙවීම් පිළිබඳ නීති පැහැදිලි කරයි.
- **2026 අංක 35 දරන විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත** - මෙමගින් බලපත්‍රලාභී ක්‍රියාකරුවන් සඳහා පමණක් නොව, සියලුම විදුලි සංදේශ සේවා සපයන්නන් සඳහා බද්ද දීර්ඝ කරයි. විදුලි සංදේශ සේවා සැපයුම්වල වටිනාකම මත පදනම්ව, තානාපති අංශ සඳහා නිදහස් කිරීමක් සහිතව, බද්ද නැවත අර්ථ දැක්වීම සඳහා පවතින අයකිරීමේ විධිවිධානය අහෝසි කර නැවත ස්ථාපනය කරන අතර, 2022 ජූනි 4 වන දින සිට 15% ක ස්ථාවර අනුපාතයක් නියම කරමින්, කාල සීමාව සහ සේවා වර්ගය අනුව සකස් කළ ගාස්තු සැලැස්මක් හඳුන්වා දෙයි. අයකරගෙන ඇති මුදල් අයකිරීමේ කාලය සඳහා වන බද්දට ඇතුළත් කර, බදු ගෙවීම් වලින් බොල් ණය අඩු කිරීමට අවසර දෙන අතර, 'සපයන්නා' යන්නෙහි නව අර්ථ දැක්වීමක් හඳුන්වා දෙයි.
- **2026 අංක 34 දරන මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත** - ජාල ව්‍යාප්තිය දිරිගැන්වීම සඳහා 2026 වර්ෂය සඳහා වන අයවැය යෝජනාවක් ක්‍රියාත්මක කරමින්, 2026 ජනවාරි 1 වන දින හෝ එදිනට පසු වාණිජ මෙහෙයුම් ආරම්භ

කරන, අලුතින් ඉදිකරන ලද දුරකථන සන්නිවේදන කුළුණු මෙහෙයුම් ආරම්භ කරන දින සිට වසර පහක කාලයක් සඳහා දුරකථන සන්නිවේදන කුළුණු බද්දෙන් නිදහස් කරයි.

- **2026 අංක 32 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත** - මුළු දූෂක ප්‍රමාණය පදනම් කරගෙන උපායමාර්ගික පාරිසරික ඇගයීම්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, නිෂ්පාදකගේ විස්තීර්ණ වගකීම, අන්තරායකර අපද්‍රව්‍ය බලපත්‍ර, රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සහ අපජලය බැහැර කිරීමේ ගාස්තු ආවරණය කිරීම පිණිස මධ්‍යම පරිසර අධිකාරියේ බලතල පුළුල් කරයි. උල්ලංඝනය කිරීම් සඳහා අනුමැතීන් අවලංගු කරමින්, ස්ථානීය නිෂ්කාශනය සහ බලපත්‍ර ලබාදීමේ නියමයන් ශක්තිමත් කරයි. දඬුවම් සැලකිය යුතු ලෙස වැඩි කරයි (රු. 250,000 සිට රු.මි. 15 දක්වා දඩ සහ වසර තුනක් දක්වා සිර දඬුවම්); IV(ආ) කොටස යටතේ වන වැරදි සෝදිසි කළ යුතු වැරදි බවට පත් කරයි; පරිසරය ප්‍රතිසංස්කරණය කරන ලෙස නියෝග කිරීම සඳහා අධිකරණවලට බලය ලබා දෙයි; සහ තමන් නියෝජනය කරන සංවිධානය විසින් කරන ලද වැරදි සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ සහ නිලධාරීන්ගේ පුද්ගලික වගකීම හඳුන්වා දෙයි.
- **2026 අංක 33 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත** - ශ්‍රී ලංකාවෙන් පිටත සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් සිදු කරන ලද ක්‍රියා, අපරාධ දේපළවල අර්ථලාභී අයිතිය අත්පත් කර ගැනීම සහ එවැනි දේපළ පරිවර්තනය කිරීම ආවරණය කිරීම සඳහා මුදල් විශුද්ධිකරණ වරද පුළුල් කරයි; ප්‍රකාශිත වරදට පූර්ව වරදකරු කර තිබීමේ අවශ්‍යතාවය ඉවත් කරයි; සහ 'නීති විරෝධී ක්‍රියාකාරකම්' අතථ්‍ය වත්කම්, සයිබර් අපරාධ, පාරිසරික අපරාධ සහ දූෂණය ඇතුළුව කාණ්ඩ 28 ක් දක්වා පුළුල් කරයි. වත්කම් තහනම් කිරීමේ සහ රාජසන්තක කිරීමේ බලතල ශක්තිමත් කරයි; වත්කම් කළමනාකරණය අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරියෙහි ආදායම සමග ඒකාබද්ධ කරයි, මහේස්ත්‍රාත් අධිකරණයේ අවසරයට යටත්ව විශේෂ විමර්ශන ශිල්පීය ක්‍රම හඳුන්වා දෙයි; දඬුවම් රු. මිලියන 5 ක් සහ වසර තුනක සිර දඬුවම් දක්වා ඉහළ නංවයි; ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා සාපරාධී කාරණා වලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය දැක්වීමේ පනත අදාළ කරයි.

## III. තෝරාගත් අමාත්‍ය මණ්ඩල තීරණ

### කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග

- වියට්නාම කෘෂිකර්ම විද්‍යා ඇකඩමිය සමග එළඹෙන ලද 2025 අවබෝධතා ගිවිසුමක් යටතේ, ක්ෂේත්‍ර අත්හදා බැලීම් සහ පර්යේෂණ නිලධාරීන් පුහුණු කිරීම ඇතුළත්ව, ජානප්ලාස්ම ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම සහ දෙමුහුන්කරණය හරහා ඉහළ අස්වැන්නක් ලබා දෙන, ලවණතාවයට ඔරොත්තු දෙන වී වර්ග සංවර්ධනය කිරීම සඳහා වියට්නාමය සමග ඒකාබද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලදී. (2026 මැයි 25)
- යුරෝපා සංගමයට අපනයනය කරන නැවුම් එළවළු සහ පලතුරු ශ්‍රී ලාංකීය යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (SLGAP) යටතේ සහතික කර ඇති ගොවිපළ, ලියාපදිංචි අපනයනකරුවන් සහ සහතික කළ ඇසුරුම්හල් වලින් පමණක් ලබා ගැනීමේ අනිවාර්ය අවශ්‍යතාවය හඳුන්වා දෙනු ලබන අතර, එය ශ්‍රී ලංකීය අපනයනවල ඇති අධික පළිබෝධනාශක අවශේෂ මට්ටම් පිළිබඳ යුරෝපා සංගමයේ සොයාගැනීම් වලට ප්‍රතිචාර වශයෙන් යැයි පවසනු ලැබේ. (2026 මැයි 25)
- වී අලෙවි මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන වී තොග මෙට්‍රික් ටොන් 115,000 ක් පමණ ටෙන්ඩර් පටිපාටියක් හරහා අලෙවි කිරීම අනුමත කරන ලද අතර, එය ආරක්ෂක තොග රඳවා ගැනීම, ඉදිරි යල කන්නය සඳහා ගබඩා ඉඩ නිදහස් කර ගැනීම සහ වී මිලදී ගැනීමට අරමුදල් සපයා ගැනීම සඳහා යැයි පවසනු ලැබේ. (2026 මැයි 25)
- 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්ම ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම, එම සංශෝධනය ගැසට් පත්‍රයේ පළ කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලද අතර, එම සංශෝධනය මගින් නිල තනතුරු නාම යාවත්කාලීන කිරීමට සහ 'අපනයන කෘෂිකාර්මික බෝගය' යන්නෙහි අර්ථ දැක්වීම පැහැදිලි කිරීමට අරමුණු කරයි. (2026 මැයි 25)
- 2026 යල කන්නය සඳහා ගොවිජන සේවා කමිටු හරහා අනුමත කරන ලද අතිරේක යූරියා පොහොර මෙට්‍රික් ටොන් 15,000 ක් ප්‍රසම්පාදනය කිරීම සහ කිලෝග්‍රෑම් 50 බෑගයක් රු. 10,200 ක් වූ ස්ථාවර ගොවිපළ මිලකට සපයා දීම (මුළු අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 75,000 ක් පමණ වන අතර එයින් 48,297.87 ක් දැනටමත් මිලදී ගෙන ඇත). (2026 මැයි 18)
- නිල්වලා ගඟේ ලවණ බාධකය ඉදිකිරීම හේතුවෙන් ඇති වූ ගංවතුරෙන් පීඩාවට පත් මාතර දිස්ත්‍රික්කයේ වී ගොවීන් සඳහා අක්කරයකට රු. 40,000 සිට රු. 64,102 දක්වා වූ පරිමාණයක් යටතේ වගා කන්න හතක් (2019 යල කන්නයේ සිට 2022 යල කන්නය දක්වා) ආවරණය වන පරිදි රු.මි. 1,200 ක වන්දි මුදලක් ගෙවීම අනුමත කරන ලදී. (2026 මැයි 18)
- රොන්මඩ තැන්පත් වීම, ව්‍යුහාත්මක දුර්වලතා සහ දේශගුණික විපර්යාස හේතුවෙන් බලපෑමට ලක් වූ කුඩා පරිමාණ වාරිමාර්ග සහ එල්ලංගා පද්ධති පුනරුත්ථාපනය කිරීම සඳහා 'වාරි මහිම - අපේ උරුමය' ජාතික වැඩසටහන යටතේ 2026 අයවැයෙන් රු.මි. 1,000 ක් වෙන් කිරීම අනුමත කරන ලදී. (2026 මැයි 11)

- යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය හේතුවෙන් කුඹුරු ඉඩම් අහිමි වූ සහ විකල්ප කුඹුරු ඉඩම් ලබා දිය නොහැකි පවුල් 245 ක් සඳහා පවුලකට රුපියල් 1,800,000 ක අතිරේක වන්දි මුදලක් ගෙවීම අනුමත කරන ලද අතර, මෙයට පෙර වටයකදී පවුල් 540 ක් ආවරණය කරන ලදී. (2026 මැයි 11)
- 1958 අංක 29 දරන සත්ව පනත යටතේ ගවයන්ට සහ මී හරකුන්ට අමතරව ඌරන්, එළුවන් සහ බැටළුවන් ඇතුළත් කිරීම සඳහා 'සත්වයා' යන අර්ථ දැක්වීම දීර්ඝ කිරීම පිණිස එම පනත සංශෝධනය කිරීම, ගැසට් පත්‍රයේ පළ කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී. (2026 මැයි 11)

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන

- මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන 2024 වර්ෂයේ නියෝගවල පැවති අඩුපාඩු සම්පූර්ණ කරමින්, දේශීය නියෝජිතයන් හරහා ක්‍රියාත්මක වන විදේශීය මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි කිරීම සඳහා තිබිය යුතු සුදුසුකම් දීර්ඝ කරමින්, 2025 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී. (2026 මැයි 25)
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීම / ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම වැළැක්වීම සඳහා වන ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සැලැස්මෙහි කොටසක් ලෙස ආසියාව පුරා සිටින රක්ෂණ නියාමකයින් සමග අධීක්ෂණ තොරතුරු හුවමාරු කර ගැනීමට හැකි වන පරිදි, AIA සමූහයේ අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකත්වය ලබා ගැනීම පිණිස හොංකොං රක්ෂණ අධිකාරිය සමග සම්බන්ධීකරණ ගිවිසුමකට එළඹීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට අනුමැතිය ලබා දෙන ලදී. (2026 මැයි 18)
- සන්නද්ධ ගැටුම් පැවති වකවානුවේදී ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් හේතුවෙන් මියගිය හෝ ආබාධිත වූ, අලුතින් හඳුනාගන්නා ලද කාණ්ඩ වලට අයත් ශ්‍රී ලංකා පොලිසියේ, විශේෂ කාර්ය සාධක බලකායේ සහ ත්‍රිවිධ හමුදාවල සාමාජිකයන්ට දැනට පවතින දීමනා වලට බලපෑමක් නොවන පරිදි සහන සැලසෙන තනි පොදු චක්‍රලේඛයක් නිකුත් කිරීම සඳහා නිලධාරී කමිටුවේ නිර්දේශ අනුමත කරන ලදී. (2026 මැයි 18)
- 2026 මැයි 16 දින සිට බලපැවැත්වෙන පරිදි මාස තුනක කාලයක් සඳහා මෝටර් රථ ආනයන සඳහා වන 30% ක ආනයන තීරු බද්ද මත 50% ක අධිභාරයක් පැනවීමේ නියමය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලද අතර, 2026 මැයි 16 දිනෙන් පසු විවෘත කරන ලද ණයවර ලිපි සඳහා (සහ වාහන සංඛ්‍යාව, හඳුනාගැනීමේ අංකය, වාහනයේ විස්තර හෝ පිරිවිතර සම්බන්ධයෙන් පසුව සංශෝධනය කරන ලද පෙර ණයවර ලිපි සඳහා) මෙය අදාළ වේ. (2026 මැයි 18)
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ පාලන රාමුව වර්තමාන ව්‍යාපාරික පරිසරයට අනුකූල වන පරිදි සකස් කර එහි ලාභදායිත්වය වැඩි දියුණු කිරීම සඳහා 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීමට නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමට අනුමත කරන ලදී. (2026 මැයි 11)
- කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් 74,000 ට අධික සංඛ්‍යාවකට සහ 1,700 ක් පමණ වූ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ප්‍රයෝජනවත් වනු පිණිස ඉගෙනුම් සහ කළමනාකරණ පද්ධති ඩිජිටල්කරණය කිරීම සඳහා වසර දෙකක් (2026-2027) තුළ රු.මි. 476 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් කැලණිය විශ්වවිද්‍යාලයේ ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලදී. (2026 මැයි 4)
- මුදල් ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබා දීම, අධීක්ෂණය, නිරාකරණය, ආයතනික යහපාලනය, තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සහ මූල්‍ය සමාගම් විසින් අනවසර තැන්පතු භාර ගැනීමට එරෙහිව බලගැන්වීම සඳහා 2011 අංක 42 දරන මදල් ව්‍යාපාර පනත සංශෝධනය කරන පනත් කෙටුම්පතක් සකස් කිරීමට නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම අනුමත කරන ලදී. (2026 මැයි 4)
- ප්‍රයිම් මෙල්වා පෝට් සිටි (පුද්.) සමාගම (එ.ජ.ඩො.මි. 127.6) සහ හෝම් ලෑන්ඩ්ස් පෝට් සිටි (පුද්.) සමාගම (එ.ජ.ඩො.මි. 150.0) කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ අති සුඛෝපභෝගී නේවාසික කුළුණු ව්‍යාපෘති සඳහා උපායමාර්ගික වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාර ලෙස නම් කිරීම අනුමත කරන ලද අතර, මේ යටතේ රැකියා 1,170 ක් පමණ නිර්මාණය වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. (2026 මැයි 4)
- තොරතුරු තාක්ෂණය, සැපයුම් සේවා, උපදේශන සේවා, මහජන උපයෝගිතා සහ යටිතල පහසුකම් සහ සමුද්‍රීය තාක්ෂණය යන අංශවලට අයත් සමාගම් හයක් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ උපායමාර්ගික වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාර ලෙස නම්කිරීම අනුමත කරන ලද අතර, මේ යටතේ වසර පහක් තුළ දළ වශයෙන් එ.ජ.ඩො.මි. 14.6 ක විදේශ ආයෝජන සහ නව රැකියා 650 ක් අපේක්ෂා කරනු ලැබේ. (2026 මැයි 4)

## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන

- ශ්‍රී ලංකාවේ උක් අස්වැන්න වැඩි කිරීම සහ සීනි ආනයනය මත යැපීම අඩු කිරීම සඳහා උක් පර්යේෂණ ආයතනය, ජාතික විද්‍යා පදනම, බ්‍රසීල සහයෝගිතා නියෝජිතායතනය සහ සාඕ කාලෝස් ෆෙඩරල් විශ්ව විද්‍යාලය සම්බන්ධ කර ගනිමින් මාස 36 ක් පුරා 'ශ්‍රී ලංකාවේ උක් ව්‍යාපෘතිය' ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ බ්‍රසීලය අතර සහයෝගිතා ගිවිසුමකට එළඹීම අනුමත කරන ලදී. (2026 මැයි 25)

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මත ඇති අසමානුපාතික නියාමන බර අඩු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව සකස් කරන ලද ජාතික නියාමන ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ මධ්‍යම යාන්ත්‍රණය ලෙස ජනාධිපතිවරයාගේ සභාපතිත්වයෙන් යුත් ජාතික නියාමන ප්‍රතිසංස්කරණ කවුන්සිලය පිහිටුවීම අනුමත කරන ලදී. (2026 මැයි 18)
- 2030 වර්ෂය වන විට භාණ්ඩ හා සේවා අපනයනයෙන් ඩී.ජ.ඩො.බි. 36 ක විදේශ විනිමය ඉපැයීමට ඉලක්ක කරමින් 'ශ්‍රී ලංකා ජාතික අපනයන සංවර්ධන සැලැස්ම - 2026-2030' අපනයන සංවර්ධනය සඳහා වන නිල උපායමාර්ගික රාමුව ලෙස පිළිගන්නා ලදී. (2026 මැයි 4)
- 'ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව' සහ 'අමාත්‍යාංශ ව්‍යාපෘති ඇගයීම් කමිටුව' විසින් ව්‍යාපෘති යෝජනා 16 ක් ඇගයීමෙන් පසු, ප්‍රාදේශීය කර්මාන්තපුර නවයකින් වසර 35 ක කල්බදු පදනම මත ආයෝජකයින්ට ඉඩම් කට්ටි වෙන්කර දීම අනුමත කරන ලදී. (2026 මැයි 4)

### කම්කරු

- රාජ්‍ය ව්‍යවසායවල ප්‍රධාන මෙහෙයුම් සිදුකිරීම සඳහා මෑන්පවර් ආයතනවල සේවකයන් යොදාගැනීම ගැනීම නියාමනය කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 'සමාන වැඩ සඳහා සමාන වැටුප්' යන මූලධර්මයට අනුකූලව එම සේවකයන්ගේ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ යෝජනා කිරීම සඳහා කමිටුවක් පත් කිරීම අනුමත කරන ලදී. (2026 මැයි 25)
- ශ්‍රී ලාංකික සේවකයන් සඳහා ඇති රැකියා අවස්ථා ආරක්ෂා කරමින්, විදේශීය සේවකයන් මෙරටට ඇතුළත් කර ගැනීම සහ ඔවුන්ව නියාමනය කිරීම සඳහා කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් මෙහෙයුම් කමිටුවක් විසින් මධ්‍යගත, විනිවිදභාවයෙන් යුතු රාමුවක් ස්ථාපිත කර, රට තුළට ශ්‍රමිකයන් සංක්‍රමණය වීම පිළිබඳ ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීම සඳහා අනුමැතිය ලබා දුන්නේය. (2026 මැයි 18)
- 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම පනතේ 7(3), 13(2) සහ 20(අ)(3) වගන්ති යටතේ වන දඩ මුදල් රු. 10,000 සිට රු. 100,000 දක්වා දස ගුණයකින් වැඩි කිරීම සඳහා වන සංශෝධන පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 මැයි 11)

### බලශක්ති

- චර්යාමය වෙනස්කම් තුළින් විදුලි පරිභෝජනය ඉහළ පුනර්ජනනීය උත්පාදනයක් සහිත කාල පරිච්ඡේදවලට යොමු කිරීම හරහා බලශක්ති කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම පිණිස පෞද්ගලික අංශයේ සහ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව, රාජ්‍ය ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන තුළ 'සුරකිමු ලංකා' ජාතික බලශක්ති ආරක්ෂණ මෙහෙයුම ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලදී. (2026 මැයි 25)

### අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන

- බර්මින්හැම් විශ්ව විද්‍යාලය සහ තවත් විදේශීය ආයතන 11 ක් සම්බන්ධ කර ගනිමින්, එක්සත් රාජධානියේ 'ජාතික සෞඛ්‍ය හා සමාජ පර්යේෂණ ආයතනය' විසින් ලබාදෙන රු.මි. 173.92 ක අරමුදල් සැපයීම මත, යාපනය විශ්ව විද්‍යාලය විසින් කාන්තාවන්ට සහ ළමයින්ට එරෙහි හිංසනය පිළිබඳ 'ගෝලීය සෞඛ්‍ය පර්යේෂණ කණ්ඩායමේ' සිව් අවුරුදු ව්‍යාපෘතියකට සම්බන්ධවීම සඳහා වන සහයෝගීතා ගිවිසුමකට එළඹීම අනුමත කරන ලදී. (2026 මැයි 18)

### වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන

- දැනට පවතින 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ උපායමාර්ගික මගපෙන්වීම සපයා දීම සඳහා සහ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සහ අනෙකුත් අදාළ ආයතන අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම සඳහා පුළුල් ජාතික බුද්ධිමය දේපළ ප්‍රතිපත්තියක් සකස් කිරීම අනුමත කරන ලදී. (2026 මැයි 18)
- ආනයනික අර්තාපල් සඳහා දැනට පවතින කිලෝග්‍රෑමයකට රු. 80 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට අමතරව ගොවිපළ මිල ස්ථාවර කිරීම සඳහා සීමාසහිත ලංකා සතොස සමාගමේ අලෙවිහල් හරහා අලෙවි කිරීම පිණිස නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කවල දේශීය ගොවීන්ගෙන් (එක් ගොවියෙකුගෙන් කිලෝග්‍රෑම් 1,000 දක්වා) සෘජුවම අර්තාපල් මිලදී ගැනීමට සමූපකාර තොග වෙළඳ සංස්ථාවට අනුමැතිය ලබා දෙන ලදී. (2026 මැයි 18)
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පතක් සකස් කිරීම කඩිනමින් සිදු කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම අනුමත කරන ලදී. (2026 මැයි 4)

### විද්‍යා හා තාක්ෂණ

- ජාත්‍යන්තර සහයෝගීතාවය විධිමත් කිරීම, ගෝලීය අභ්‍යවකාශ පාලනය තුළ ශ්‍රී ලංකාවේ කාර්යභාරය ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර අභ්‍යවකාශ බැඳීම්වලට අනුකූල වීම සහතික කිරීම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකාව සඳහා ජාතික අභ්‍යවකාශ ප්‍රතිපත්තියක් සකස් කිරීම පිණිස විශේෂඥ කමිටුවක් පත් කිරීම අනුමත කරන ලදී. (2026 මැයි 18)

### නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන

- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව එහි මෙහෙයුම් පිරිවැය පියවා ගැනීම සඳහා දැනට පවතින ගාස්තු ප්‍රමාණවත් බව තහවුරු කරමින්, 2026 පළමු මාස හය සඳහා සංශෝධනය කිරීමකින් තොරව පවතින ජල ගාස්තු එලෙසම පවත්වාගෙන යාම අනුමත කරන ලදී. (2026 මැයි 18)
- බස්නාහිර පළාතේ සහ යාපනයේ පිහිටි ජල පිරිපහදු, සැපයුම්, ආදායම් නොලබන ජල කළමනාකරණ සහ අපජල ඇතුළු උප ව්‍යාපෘති පහක් ආවරණය කරමින්, ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් යටතේ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව සහිත තිරසාර ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය (මුළු පිරිවැය එ.ජ.ඩො.මි. 250 ක් වන අතර, එයින් එ.ජ.ඩො.මි. 200 ක් ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් වේ) අනුමත කරන ලදී. (2026 මැයි 4)

### සෞඛ්‍ය හා ජනමාධ්‍ය

- 'ක්ලීන් ශ්‍රී ලංකා' වැඩසටහන යටතේ සපයා දෙන රු.මි. 833 ක මුදලක් වැයකරමින්, ශ්‍රී ලංකා පොලිසිය සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණයෙන් යුතුව ස්වාධීන රූපවාහිනී ජාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන 'Take Care - සුරැකෙමු මගතොට' මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය වසරකට පාසල් 60 සිට 100 දක්වා පුළුල් කරමින් 2026-2028 කාලය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 මැයි 18)
- 'ක්ලීන් ශ්‍රී ලංකා' වැඩසටහන යටතේ සපයා දෙන රු.මි. 600 ක මුදලක් වැයකරමින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලබන 'පෝෂණය සහ ආහාර සුරක්ෂිතතාවය' පිළිබඳ 'Healthy Food – Happy Life' ජාතික මාධ්‍ය ව්‍යාපෘතිය 2026-2028 කාලය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 මැයි 18)

### විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක

- විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයාගේ නිල සංචාරයක් අතරතුරදී (2026 මැයි 12-15) බෙලරුස් ජනරජය සමග 'ගුවන් සේවා ගිවිසුම' සහ 'උසස් අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවා සහයෝගීතාවය' පිළිබඳ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 මැයි 11)
- වියට්නාම ජනාධිපතිවරයාගේ රාජ්‍ය සංචාරය අතරතුරදී (2026 මැයි 7-8) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, සංස්කෘතික සහයෝගීතාවය, ආගමික අංශ සංවර්ධනය, විද්‍යාව හා තාක්ෂණය සහ පොලිස් පුහුණුව සහ පර්යේෂණ ආවරණය වන අවබෝධතා ගිවිසුම් පහක් අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 මැයි 4)

### බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු

- ඉන්දියානු රජයේ ආධාර ඇතිව ඉදිකරන ලද, මහල් එකොලහකින් සමන්විත පහසුකමක් වන යාපනය තිරුවල්ලුවාර් සංස්කෘතික මධ්‍යස්ථානය යාපනය නගර සභාවට පවරා දීමෙන් පසුව එය කළමනාකරණය කිරීම සඳහා භාරයක් ස්ථාපනය කිරීම අනුමත කරන ලද අතර, භාර ඔප්පු කෙටුම්පතට නීතිපතිවරයාගේ අනුමැතිය ලැබී ඇත. (2026 මැයි 11)

### ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන

- මරදාන සිට අවිස්සාවේල්ල දක්වා කැලණිවැලි දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම අනුමත කරන ලද අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතක් පුරා එම අත්පත් කර ගැනීම් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සිදු කිරීමට නියමිතය. (2026 මැයි 4)
- දුම්රිය ප්‍රවාහන පද්ධතියේ යටිතල පහසුකම් ඉදිකිරීම, නවීකරණය, විද්‍යුත්කරණය, ඩිජිටල්කරණය සහ උපදේශන සේවා සහ දුම්රිය උපකරණ සහ අමතර කොටස් සැපයීම ආවරණය වන පරිදි රුසියානු සමූහාණ්ඩුව සමග දුම්රිය ප්‍රවාහන යටිතල පහසුකම් සහයෝගීතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 මැයි 4)

### කාන්තා හා ළමා කටයුතු

- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුකූලව පවුල්වලට සහයෝගය දැක්වීමට, පවුල් පාදක විකල්ප සත්කාර සඳහා ප්‍රමුඛත්වය දීමට සහ ළමයින් සඳහා ආයතනික රැකවරණය සැලසීම ක්‍රමයෙන් අඩු කිරීමට කැපවෙමින්, 'ළමුන්ගේ රැකවරණ ප්‍රතිසංස්කරණ සඳහා වන ගෝලීය ප්‍රඥප්තිය' ශ්‍රී ලංකාව විසින් පිළිගැනීම අනුමත කරන ලදී. (2026 මැයි 4)

---

*වියාචනය - නීතිය හා සමාජ භාරය විසින් පවරන ලද පරිදි සකස් කරන ලද මෙම ලියවිල්ල කෙටි සාරාංශයක් පමණක් වන අතර, මෙහි කිසිදු නෛතික විශ්ලේෂණයක් අඩංගු නොවන බැවින්, නීති උපදෙස් ලෙස මෙය කෙරෙහි විශ්වාසය නොතැබිය යුතුය. වැඩිදුර තොරතුරු, නිවැරදි කිරීම් හෝ පැහැදිලි කර ගැනීම් සඳහා සම්බන්ධ කර ගන්න: tegal.lawchambers@gmail.com*